අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) සෑම සලාතයකට පසුවම මෙසේ තහ්ලීල් පවසන්නෙකු ලෙස සිටයහැයි මෙතුමා තවදුරටත් පවසා සිටියහ

අබූ සුබෙයිර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී: සැබැවින්ම සෑම සලාතයකටම පසුව සලාම් පවසන අවස්ථාවේ එතුමා මෙසේ පවසන්නට වූහ. “ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහූ ලා ෂරීක ලහූ ලහුල් මුල්කු වලහුල් හම්දු වහුව අලා කුල්ලි ෂෙයිඉන් කදීර්. ලා හව්ල වලා කුව්වත ඉල්ලා බිල්ලාහි ලා ඉලාහ ඉල්ලල්ලාහු වලා නඃබුදු ඉල්ලා ඉයියාහු ලහුන් නිඃමතු වලහුල් ෆල්ලූ වලහුල් සනාඋල් හසන් ලා ඉලාහ ඉල්ලල්ලාහු මුහ්ලිසීන ලහුද්දීන වලව් කරිහල් කාෆිරූන්.” තේරුම: නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් කිසිවෙක් හෝ කිසිවක් හෝ නොමැත. ඔහු ඒකීයය. ඔහුට කිසිදු හවුල් කරුවෙකු නොමැත. සියලු බලතල ඔහු සතුය. ප්රශංසා සියල්ල ඔහුටමය. සෑම දෙයක් කෙරෙහිම ඔහු ශක්තිය ඇත්තාය. අල්ලාහ්ගෙන් හැර කිසිම ශක්තියක් හෝ බලවේගයක් නොමැත. ඔහු හැර වෙනත් දෙවියෙකු නැත. ඔහු හැර වෙන කිසිවෙකුට අපි නැමදුම් නොකරන්නෙමු. සියලූ දායාදයන් ඔහු සතුය. ශේර්ෂ්ඨත්වය ද උතුම්
වූ උපහාරය ද ඔහුටම හිමිය. නැමදුමට සුදුස්සා ඔහු හැර වෙන කිසිවෙක් හෝ කිසිවක්
නොමැත. ප්රතික්ෂේප කරන්නන් විරුද්ධ වුව ද සියලු නැමදුම් ඔහු වෙනුවෙන් පමණක් ඉටු කරමු. අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) සෑම සලාතයකට පසුවම මෙසේ තහ්ලීල් පවසන්නෙකු ලෙස සිටයහැයි මෙතුමා තවදුරටත් පවසා සිටියහ. [صحيح] [رواه مسلم]

සෑම අනිවාර්යය සලාතයකම සලාම් කීමෙන් පසු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙම මහඟු අනුවාදය තුළින් අල්ලාහ්ව ඒකීයත්වයට පත් කරන්නෙකු වූහ. එහි තේරුම: “ලා ඉලාහ ඉල්ලල්ලාහු" සැබෑ ලෙස නැමදුම් ලබන්නට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් කිසිවෙක් හෝ කිසිවක් හෝ නොමැත. "වහ්දහූ ලා ෂරීක ලහූ" (ඔහු ඒකීයය. ඔහුට කිසිදු හවුල් කරුවෙකු නොමැත.) එනම්: ඔහුගේ දේවත්වය, ඔහුගේ පරිපාලනත්වය, ඔහුගේ නාම හා ගුණාංග වල ඔහුට කිසිදු හවුල් කරුවකු නොමැත. "ලහුල් මුල්කු" (සියලු බලතල ඔහු සතුය.) එනම්: නිරපේක්ෂ, විශ්වීය සහ පුළුල් ආධිපත්යය ඔහු සතුය. අහස් හා මහපොළොව ද ඒ දෙක අතර ඇති දෑහි ආධිපත්යය ඔහු සතුය. "වලහුල් හම්දු" ප්රශංසා සියල්ල ඔහුටමය. එනම්: ඔහු පූර්ණවත් ගුණාංගවලින් වර්ණනා කරනු ලබන්නාය. දුක හා සතුට යන සෑම අවස්ථාවකම ඔහුට ආදරය දැක්වීමෙන් හා ගරු බුහුමන් කිරීමෙන් ඔහු පූර්ණවත් ලෙස ප්රශංසාලාබීය. "වහුව අලා කුල්ලි ෂෙයිඉන් කදීර්" (සෑම දෙයක් කෙරෙහිම ඔහු ශක්තිය ඇත්තාය.) එනම්: ඔහුගේ බලය පූර්ණවත්ය. සෑම ආකාරයකින්ම පරිපූර්ණවත්ය. කිසිවක් ඔහුට අපොහොසත් වන්නේ නැත. කිසිදු කරුණක් ඔහුව වළක්වන්නේ ද නැත. "ලා හව්ල වලා කුව්වත ඉල්ලා බිල්ලාහි" (අල්ලාහ්ගෙන් හැර කිසිම ශක්තියක් හෝ බලවේගයක් හෝ නොමැත.) එනම්: අල්ලාහ්ගෙන් තොරව, එක් තත්ත්වයකින් තවත් තත්ත්වයකට වෙනස් වීමට, අල්ලාහ්ට පිටුපෑමෙන් ඔහුට අවනත වීම සඳහා හැරීමට හැකියාවක් හෝ ශක්තියක් හෝ නැත. ඔහු උපකාර කරන්නාය. සියලු පැවරුම් ඔහු මත පැවරේ. "ලා ඉලාහ ඉල්ලල්ලාහු වලා නඃබුදු ඉල්ලා ඉයියාහු" (ඔහු හැර වෙනත් දෙවියෙකු නැත. ඔහු හැර වෙන කිසිවෙකුට අපි නැමදුම් නොකරන්නෙමු.) මෙය දේවත්වයේ අර්ථය සහතික කරමින් බහුදේවත්වය ප්රතික්ෂේප කිරීමකි. සැබැවින්ම ඔහු හැර නැමදුම් ලබන්නට වෙනත් කිසිවකු සුදුසු නැත. "ලහුන් නිඃමතු වලහුල් ෆල්ලූ" (සියලු දායාදයන් ඔහු සතුය. ශේර්ෂ්ඨත්වය ද ඔහු සතුය.) එනම්: ආශිර්වාද බිහි කර ඒවා තමන් සතුව තබා ඇත්තාය.

ඔහු අභිමත කරන ගැත්තන් හට එමගින් ඔහු ආශිර්වාද කරනු ඇත. "වලහුල් සනාඋල් හසන්" (උතුම් වූ උපහාරය ද ඔහුටම හිමිය.) එනම්, ඔහුගේ පැවැත්ම, ඔහුගේ ගුණාංග, ඔහුගේ ක්රියාවන් හා ඔහුගේ ආශිර්වාදයන් මත හා සියලු වාතාවරණයන් මත උතුම් වූ උපහාරය ඔහුටම හිමිය. "ලා ඉලාහ ඉල්ලල්ලාහු මුහ්ලිසීන ලහුද්දීන” (නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙන කිසිවෙක් හෝ කිසිවක් නොමැත. අවංකයින් ලෙස ඔහුටම දහම පුද කරමු.) එනම්: අල්ලාහ්ට අවනත වීමෙහි කිසිදු මුහුණිච්චාවක් හෝ ප්රදර්ශණය කිරීමකින් තොරව ඒකීයත්වයට පත් කරන්නන් ලෙසින්. "වලව් කරිහල් කාෆිරූන්” (ප්රතික්ෂේප කරන්නන් විරුද්ධ වුව ද) එනම්: දේවත්වය ප්රතික්ෂේප කරන්නන් පිළිකුල් කළ ද, අල්ලාහ් ඒකීයත්වයට පත් කිරීමෙහි හා ඔහුට නැමදුම් කිරීමෙහි ස්ථාවර ව සිටින්නන් ලෙසින්.

http://www.sunnah.global/hadeeth/si/show/6203